# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 305 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 20/02/2024 පැය 1145

## මාධ්‍ය නිවේදනය

### 01. මාරක රිය අනතුරක් - කයිට්ස් පොලිස් වසම.

2024.02.19 වන දින දහවල් කාලයේ කයිට්ස් පොලිස් වසමේ කයිට්ස් යාපනය මාර්ගයේ අල්ලපිඩ්ඩි හංදියේදී කයිට්ස් දෙස සිට යාපනය දෙසට ධාවනය වූ බස්රථයක ගමන් ගත් මගී කාන්තාවක් බස් රථය නැවැත්වීමට පෙර බැසීමට උත්සාහ කිරීමේදී බස් රථයෙන් බිමට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව යාපනය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 48 ක් වූ කයිට්ස් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කයිට්ස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - පන්නල පොලිස් වසම.

2024.02.19 වන දින රාත්‍රී කාලයේ පන්නල පොලිස් වසමේ පන්නල ගිරිඋල්ල මාර්ගයේ තලම්මැහැර ප්‍රදේශයේදී ත්‍රීවිල් රථයක් මාර්ගය හරහා ගමන් කිරීමේදී පන්නල දෙස සිට ගිරිඋල්ල දෙසට ධාවනය වූ කාර් රථයක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීවිල් රථයේ පිටුපස ගමන් කළ කාන්තාවක් තුවාල ලබා දඹදෙනිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරින් පසු කාර් රථයේ රියදුරු කාර් රථය සමග පලාගොස් ඇති අතර රියදුරු අත්අඩංගුවට ගැනීම සඳහා පන්නල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - හසලක පොලිස් වසම.

2024.02.19 වන දින සවස් කාලයේ හසලක පොලිස් වසමේ හසලක හෙට්ටිපොල මාර්ගයේ මීගොල්ල ප්‍රදේශයේදී දඹුල්ල දෙස සිට හසලක දෙසට ගමන් කල ලොරි රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු තුවාල ලබා හසලක රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ හෙට්ටිපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හසලක රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට අදාල ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. හසලක පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - පුනරින් පොලිස් වසම.

2024.02.19 වන දින රාත්‍රී කාලයේ පුනරින් පොලිස් වසමේ පරමන්කිරායි හංදිය අසලදී යාපනය දෙස සිට පුනරින් දෙසට ගමන් කළ ටිපර් රථයක ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරුපැදියක් මුහුණට මුහුණ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදි කරු හා පසු පැදි කරු පුනරින් රෝහලට ඇතුලත් කිරීමේදී යතුරුපැදි කරු මියගොස් ඇත. පසු පැදි කරු වැඩිදුර ප්‍රතිකාර සඳහා යාපනය රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ඉරණමඩු හන්දිය, භාතියපුරම්, කිලිනොච්චිය ක් වූ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුනරින් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**